Department of Education,Sabaragamuwa Province/ Weekly School

# පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව

**ශ්‍රේණිය 12** | **විෂය නර්තනය** | තුන්වන වාරය **B -20**

**නිපුණතාව 01 :** නර්තනය හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.3** : සාම්ප්‍රදායික ලක්ෂණ ප්‍රදර්ශනය වන සේ වන්නම් නර්තනය කරයි.

**ක්‍රියාකාරකම 1.3** : මුසලඩි /ගණපති /මයුරා වන්නම් නර්තනය කරමු. (ඇගයීම්)

**ඉගෙනුම් පල :**

- අදාළ වන්නම්වල සුවිශේෂ ලක්ෂණ විස්තර කරයි.
- වන්නමට අදාල තාල රූපය නම් කරයි.
- වන්නමට අයත් පද තාල තබමින් කියයි.
- තානම හා කවි ගායනයට අදාළ ව හස්ත චලන නිවැරදි ව ප්‍රදර්ශනය කරයි.
- වන්නමට අදාළ පද, කස්තිරම්, සීරුමාරු, අඩව් නියමිත අංගහාර අනුව නර්තනය කරයි.
- බෙර වාදනයට අනුව උගත් පද කොටස් නර්තනය කරයි.
- ගායනය කරමින් බෙර වාදනය අනුව වන්නම් ඉදිරිපත් කරයි.
- උගත් වන්නම් සාමූහික ව හා ඒකල ව ප්‍රදර්ශනය කරයි.

<u>ශිෂයා කල යුතු කාර්යයන් -</u>

- නැවතත් අන්තර් ජාලය තුලින් හෝ හඩ පටයක් තුලින් මුසලඩි /ගණපති /මයුරා වන්නම හොදින් ශ්‍රවනය කරන්න.ඒඅනුව ගායනය කරමින් මීට පෙර උගත් අලංකාර මාත්‍රා වන්නම් නර්තනය සදහා යොද ගන්න.
- අන්තර්ජාලය තුලින් හෝ වීඩියෝ දර්ශන මගින් නරඹන ලද වන්නම් වලට අනුව වන්නම් සම්පූරණයෙන්ම නැවතත් නර්තනය කරන්න.

ඉහත ක්‍රියාකාරකම් සඳහා උපකාරී කර ගත හැකි  පොත් පත් / වෙබ් අඩවි හා ඉගෙනුම් ආධාරක

- 12ශ්‍රේණිය නර්තනය අතිරේක කියවීම් පොත - ජාතික අධ්‍යාපන ආයතනය
- Youtube නාලිකා    https://www.youtube.com/watch?v=2NitXrLF60E

ඇගයීම්

- අදාළ වන්නම්හි තාල රූප නම් කරන්න.
- නැවතත් තාල තබමින් වන්නම් ගායනය කරන්න.
- බෙර වාදනයට අනුව නැවත වන්නම් මුල සිට නර්තනය කරන්න.

පහත සඳහන්  ඇගයීම් ද සිදු කරන්න.

වන්නම් නර්තනය හාසැකසුනු 12 ශ්‍රේණියට අදාල සියලු කාර්‍ය පත්‍රිකා
12 නර්තනය පලමු වන වාරය 05
12 නර්තනය දෙවන වාරය     02
12 නර්තනය තුන්වන වාරය A - 07

පසු ක්‍රියාකාරකම්

- සාම්ප්‍රදායිකව ඉගෙන ගත්මුසලඩි ගණපති  මයුරා වන්නම් නිර්මානශීලීව ගායනා කරමින් නිර්මානශීලීව නර්තනය කරන්න. වන්නම් තුනම එක් කර ගනිමින් නිර්මාණ අංගයක් සාදා ගන්න.
- ගුරුවරයාගේද සහය ලබාගෙන එය ප්‍රාසංගික නිර්මාණයක් බවට පත් කර ගන්න.

**සැකසුම - එච්. අයි. නීලකාන්ති. ර/ සුමනා බාලිකා විද්‍යාලය  . රත්නපුර කලාපය .**